# 1. අප සුරකින මැවුම්කරුවාණෝ

මිනිසාට දේව මැවිල්ලේ ප්‍රධාන තැනක් හිමි වේ. විශේෂයෙන් කුඩා දරුවන් වන ඔබගේ ජීවිතය දෙවි පියාණන් වහන්සේ ඉදිරියේ සුවිශේෂ වේ. මේ පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පාඩම තුළින් අපේක්ෂිත ය.

**උත්පත්ති 2:7-8, ශු. මතෙව් 6:25-34, ශු. මතෙව්**

"දෙවි සමිඳාණන් වහන්සේ
පූර්ව දිශාවේ ඒදන් උයනක් තනා
තමන් මැවූ මනුෂ්‍යයා එහි පිහිටෙවු සේක."
උත්පත්ති 2:8

### ඒදන් උයන

දෙවි පියාණන් වහන්සේ පොළොවෙන් ගත් දූවිල්ලෙන් මිනිසා නිර්මාණය කොට ජීවන හුස්ම ලබා දී මිනිසා වෙත ජීවය ලබා දුන් සේක. මේ නිසා මැවිල්ල තුළ මිනිසාට ප්‍රධාන තැන හිමි වේ. එසේ ම දෙවියන් වහන්සේ විසින් මිනිසා ඒදන් උයනෙහි පදිංචි කර වූ බව ශුද්ධ බයිබලය අපට පෙන්වා දෙයි. දෙවියන් වහන්සේ ඒදන් උයන තුළ මිනිසාට ජීවත් වීමට අවශ්‍ය සුරක්ෂිත පරිසරයක් ලබා දුන් සේක. එපමණක් නොව උන්වහන්සේ ඒදන් උයන ආරක්ෂා කිරීමේ වගකීම ද මිනිසා වෙත පැවරූ සේක.

## මැවිල්ල තුළ දේව රැකවරණය

අහසේ කුරුල්ලන් දෙස බලන්න.
උන් වපුරන්නේවත්, කපන්නේවත්
අටු කොටුවල
රැස් කරන්නේවත් නැත.
එහෙත්
ඔබේ ස්වර්ගීය පියාණන් වහන්සේ
උන් පෝෂණය කරන සේක.
ඔබ ඔවුනට වඩා බොහෝ වටිනවා
නොවේ ද?
ශු. මතෙව් 6:26



අහසේ නිදහසේ පියාසර කරන කුරුල්ලන් ගැන මොහොතක් සිතන්න. එම කුරුල්ලන්ගේ ජීවිත කෙතරම් නිදහස් ද? එලෙස පියාසර කරන පක්ෂීන්ට පවා දෙවියන් වහන්සේ රැකවරණය හා පෝෂණය ලබා දෙන බව ඉහත බයිබල් පාඨයෙන් පැහැදිලි වේ. එසේ නම් මැවිල්ලේ ප්‍රධාන තැන හිමි වන මිනිසාගේ ජීවිතය ද දෙවි පියාණන් වහන්සේ සුරකින සේක. එම නිසා අනවශ්‍ය දේ ගැන අප කරදර නොවී සිටීම වැදගත් වේ.

"කුමක් කමු ද?" කියා ජීවිතය ගැනවත් "කුමක් අඳිමු ද?" කියා ශරීරය ගැනවත් අප කරදර නොවිය යුතු බව ජේසුස් වහන්සේ පෙන්වා දුන් සේක.

මෙහි දී අපට පෙනෙන්නේ, දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසයෙන් අප ජීවත්වීම වැදගත් බවයි. අප විශ්වාස කරන්නේ අපගේ අවශ්‍යතා මොනවා ද කියා අප ඉල්ලන්ටත් පෙර දන්නා වූ දෙවියන්වහන්සේ ය. අප බොහෝ විට අපගේ ජවිතය ගොඩනැගීමට අවශ්‍ය කාරණා නොඉල්ලා වෙනත් කාරණා දෙවියන් වහන්සේගෙන් ඉල්ලමු.

ඒ නිසා අප සෑමවිට ම කලබල වී ඒවා ගැන සිත් තැවුල් ඇති කර ගැනීම සුදුසු නොවේ. දෙවියන් වහන්සේ තමන් වහන්සේගේ මැවිල්ල සුරක්ෂිත කරන සේක. එහෙයින් උන් වහන්සේ අපගෙන්, බලාපොරොත්තු වන්නේ කුමක් ද? අප සෙවිය යුත්තේ කුමක් ද?

**එහෙත් පළමු කොට**
**උන් වහන්සේගේ රාජ්‍යය ද,**
**ධර්මිෂ්ඨකම ද සොයන්න.**
**එවිට මේ සියල්ලත් ඔබට දෙනු ලැබේ.**
**(මතෙව් 6:33)**

දෙවියන් වහන්සේ සමග සම්බන්ධ වීම පළමු කොට අවශ්‍ය වෙයි. උන් වහන්සේගේ රාජ්‍යයට අයිති දරුවන් ලෙස ජීවත්වීම උන් වහන්සේ බලාපොරොත්තු වන සේක. උන් වහන්සේට අයිති දරුවන්ගේ ජීවිතවල පැවතිය යුතු දේව ගුණාංග සහිතව ජීවත්වීම අවශ්‍ය වෙයි.

එසේ අප දෙවියන් වහන්සේ කෙරේ විශ්වාසය තබමින්, උන් වහන්සේට අයිති දරුවන් සේ දිවි ගෙවන විට, අපගේ ජීවිතයේ අවශ්‍යතාවන් උන් වහන්සේ නිසි ලෙස අපට සපයා දෙන සේක.

## දේව මැවිල්ල තුළ දරුවන්ගේ රැකවරණය

දෙවියන් වහන්සේ උන් වහන්සේගේ මැවිල්ල තුළ දරුවන්ගේ ජීවිතවල සුරක්ෂිතභාවය සලකන සේක. ජේසුස් වහන්සේ ප්‍රකාශ කළ මෙම වචන තුළින් එම සුරක්ෂිතභාවය පිළිබඳව මනාව පැහැදිලි වෙයි.

"මා කෙරෙහි අදහා ගත් මේ
බාලයන්ගෙන් එකකුවත් නොමග
යවන යමෙක් වේද,
ඔහුගේ ගෙල වටා මහා ඇඹරුම්
ගලක් එල්ලා
මුහුදු ගැඹුරෙහි ගිල්වා දැමීම
ඔහුට යහපත"
ශු. මතෙව් 18:6



ජේසුස් වහන්සේ දරුවන්ගේ ජීවිතවල අලංකාරත්වය හා වටිනාකම දුටු සේක. ඒ නිසා දරුවන් ආරක්ෂා කිරීම සඳහා සමාජයට වැඩිපුර වගකීමක් පැවරෙන බව පෙන්වා දුන් සේක. සමාජයේ වැරදි නිසා එහි ප්‍රතිඵල දරුවන් මත පැමිණේ නම් දෙවියන් වහන්සේගේ උදහස ද ඒ සමඟ පැමිණෙන බව උන් වහන්සේගේ පැහැදිලි කළ සේක.

## අද සමාජය තුළ දරුවන්ට ඇති පීඩාවන්

- ? විවිධ පාරිසරික හානි හේතුවෙන් අනාථ වීම. (ගංවතුර, ජල ගැලීම්, නාය යෑම්, භූමි කම්පා, සුළි සුළං, නියඟය)
- ? දුප්පත්කම නිසා මහමගට වැටීම.
- ? විවිධ හිංසනවලට ගොදුරු වීම.
- ? විවිධ අතවරවලට හා අපචාරවලට මුහුණ දීමට සිදු වීම.
- ? මව පියා විදේශ ගතවීම නිසා තනි වීම.
- ? ළමා මෙහෙකාරකමෙහි යෙදවීම.
- ? යුද්ධය නිසා අසරණ වීම.
- ? දෙමාපිය සබඳතා දෙදරා යාම නිසා අසරණ වීම.
- ? මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම.
- ? විවිධ අපරාධවලට සම්බන්ධ වීම.

වත්මන් සමාජය තුළ ද ළමා අයිතීන් සුරැකීම උදෙසා විවිධ ආයතන දායක වේ. එවැනි ආයතන කිහිපයක් පහත දැක්වේ.

? ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශය

? ශ්‍රී ලංකා පොලිස් ළමා හා කාන්තා කාර්යාංශය

? පරිවාස හා ළමා රක්ෂණ දෙපාර්තමේන්තුව

? එක්සත් ජාතීන්ගේ ළමා රක්ෂණ අරමුදල

? රාජ්‍ය නො වන ස්වෙච්ඡා සංවිධාන

ළමුන්ගේ ආරක්ෂාව සැපයීම වෙනුවෙන් වෙන ම දුරකථන අංකයක් (1929)

ළමා කාලයේ සිදුවන සමාජ වැරදිවල දී, උසාවි නියෝගයෙන් දරුවන්ට සෙවණ දෙන ආයතන වන SOS ආයතනය, ශ්‍රී ලංකා ගැලවීමේ හමුදා දේවස්ථානයේ හේවන් ළමා සුරැකුම් නිවෙස යනාදී ආයතන වැදගත් වෙයි.

ඉහත සඳහන් ආයතන මගින් වර්තමානයේ දරුවන්ට සිදු වන පීඩා පිළිබඳව දැනුවත් කිරීමත්, එවැනි ක්‍රියාකාරකම්වලට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමටත් උපකාරී වේ. ඔබ ජීවත් වන පරිසරයේ කිසියම් දරුවකු පීඩාවට පත් වේ නම් එම තත්ත්වයෙන් එම දරුවා මුදවා ගැනීමට උපකාර වීම ද ඔබ සතු වගකීමකි. එවැනි පීඩාවට පත්වන දරුවන් පිළිබඳව වැඩිහිටියන් හෝ පාසලේ ගුරුවරුන් දැනුවත් කිරීමෙන් ඔවුන්ගේ ජීවිත ආරක්ෂා කරගත හැකි වේ.

දෙවි පියාණන් වහන්සේ මෙසේ ඔබගේ ජීවිතය සුරකිනවාක් මෙන්, ඔබත් අන් අයගේ ජීවිත සුරැකීමට ක්‍රියා කළ යුතු ය. එමෙන් ම සෑම පුද්ගලයෙකුගේ ම ජීවිතයට ගරු කිරීමත් වැදගත් වේ. මන්ද සෑම කෙනකුට ම ජීවය ලබා දෙන්නේ අපගේ දෙවි පියාණන් වන බැවිනි. මෙසේ පාසල් වියේ සිටින ඔබගේ ජීවිතය වටිනාකමින් යුත් ජීවිතයක් බව සිතට ගන්න. දෙවියන් වහන්සේ මැවිල්ල සුරකින අතර ඔබ ද, විශේෂයෙන් රැක බලා ගන්නා බව විශ්වාස කරන්න. එසේම ඔබත් සමාජයේ ජීවත්වීමේ දී එකිනෙකා සුරක්ෂිත කිරීමට ක්‍රියා කළ යුතු බව ද සිතේ තබාගෙන ජීවත් වන්න.

**ක්‍රියාකාරකම**

**1.** පාසලේ දී ඔබේ මිතුරාගේ හෝ මිතුරියගේ ආරක්ෂාව වෙනුවෙන් ඔබ විසින් ක්‍රියා කරන ලද අවස්ථාවක් විස්තර කරන්න.

**2.** ශු.මතෙව් 6:25-34 තුළින් දෙවියන් වහන්සේ මැවිල්ල සුරක්ෂිත කරන ආකාරය පිළිබඳ කරුණු 3 ක් ලියන්න.